**විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය**

**வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சு**

**MINISTRY OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM**


## මාධ්‍ය නිවේදනය

## විදේශගත ශ්‍රී ලාංකිකයින් වෙනුවෙන් සති අන්ත කොන්සියුලර් සේවා සැපයීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශය නියමු ව්‍යාපෘතියක් දියත් කරයි

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය විජිත හේරත්ගේ මඟ පෙන්වීම යටතේ, සෑම මසකම නම් කරන ලද සති අන්ත දිනයකදී විදේශගත ශ්‍රී ලාංකිකයින් වෙනුවෙන් කොන්සියුලර් සේවා සැපයීම සඳහා නියමු ව්‍යාපෘතියක් දියත් කර ඇත.

මෙම මුලපිරීම, ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයින්ට සහ විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකික ප්‍රජාවන්ට කොන්සියුලර් සේවා ලබා ගැනීමේ ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා රජය ගෙන ඇති අඛණ්ඩ උත්සාහයේ කොටසකි. සාමාන්‍ය රාජකාරි වේලාවන්ගෙන් බැහැරව සේවා ලබා දීම තුළින්, රාජකාරි සහ අනෙකුත් වගකීම් හේතුවෙන් සතියේ දිනවලදී සහ සාමාන්‍ය කාර්යාල වේලාවන්වල ශ්‍රී ලංකා තානාපති කාර්යාල සහ කොන්සල් කාර්යාල වලින් සේවා ලබා ගැනීමට පැමිණීමේදී දුෂ්කරතාවන්ට මුහුණ දෙන ශ්‍රී ලාංකිකයින්ට සහාය වීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි.

ආරම්භක අදියරේදී, මෙම නියමු වැඩසටහන, දකුණු කොරියාව (සෝල්), මාලදිවයින (මාලේ), සෞදි අරාබිය (රියාද් සහ ජෙඩා), ඉතාලිය (රෝමය සහ මිලාන්), කුවේට්, ඕමාන් (මස්කට්), ජෝර්දානය (අම්මාන්) සහ ඊශ්‍රායලය (ටෙල් අවිව්) යන රටවල ශ්‍රී ලංකා තානාපති කාර්යාල සහ කොන්සල් ජනරාල් කාර්යාල හරහා ක්‍රියාත්මක කෙරේ.

නියමු ව්‍යාපෘතියේ අදියර තක්සේරු කිරීමෙන් අනතුරුව, අමාත්‍යාංශය, මෙම මුලපිරීම අදියර වශයෙන් අනෙකුත් ශ්‍රී ලංකා තානාපති කාර්යාල සහ කොන්සල් කාර්යාල වෙත ව්‍යාප්ත කිරීමට අදහස් කරන අතර, හැකි සෑම අවස්ථාවකදීම සති අන්ත සේවා සැපයීමේ දින ගණන වැඩි කිරීම සම්බන්ධයෙන්ද අවධානය යොමු කරයි.

සති අන්ත කොන්සියුලර් සේවා සැපයීම සඳහා වෙන්වූ නිශ්චිත දිනයන් සහ වේලාවන් අදාළ තානාපති කාර්යාල සහ කොන්සල් කාර්යාල විසින් ප්‍රකාශයට පත් කරනු ඇත. යාවත්කාලීන තොරතුරු සඳහා අදාළ තානාපති කාර්යාල සහ කොන්සල් කාර්යාලවල නිල වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය අඩවි වෙත යොමු වන ලෙස ඉහත නම් කරන ලද රටවල පදිංචි ශ්‍රී ලාංකිකයින්ට උපදෙස් දෙනු ලැබේ.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය, සේවා සැපයීම තවදුරටත් ශක්තිමත් කිරීමට සහ විදේශයන්හි වෙසෙන ශ්‍රී ලාංකිකයින්ට වඩාත් ප්‍රතිචාරාත්මක සහ පහසුවෙන් ප්‍රවේශ විය හැකි කොන්සියුලර් සහාය ලබා දීමට කැපවී සිටියි.

**විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය**
**කොළඹ**

**2026 පෙබරවාරි 03 වැනි දින**


**Foreign Affairs**
විදේශ කටයුතු
வெளிநாட்டு அலுவல்கள்
**Republic Building, Colombo 1**
ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 1
குடியரசுக் கட்டிடம், கொழும்பு 1
☎ 2 325 373/5, 2 207 200/7
cypher@mfa.gov.lk

**Foreign Employment**
විදේශ රැකියා
வெளிநாட்டு வேலைவாய்ப்பு
**17th Floor, "Mehewara Piyesa", Narahenpita, Colombo 5**
17 වන මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 5
17 அவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 5
☎ 2 331 200
info@mfe.gov.lk

**Tourism**
සංචාරක
சுற்றுலாத்துறை
**No 03, Times Building, Bristol Street (Sir Razik Fareed Mw), Colombo 1**
අංක 03, ටයිම්ස් ගොඩනැගිල්ල, බ්‍රිස්ටල් වීදිය (සර් රාසික් ෆරීඩ් මාවත), කොළඹ 1
இல.03, டைம்ஸ் கட்டிடம், பிரிஸ்டல் தெரு (சர் ராசிக் ஃபரீத் மாவத்தை), கொழும்பு 1
☎ 2 381 798, 2 321 222
secretary@tourismmin.gov.lk